# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 501 /2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 22/03/2024
පැය 0640

## මාධ්‍ය නිවේදනය

### පොලිස් භාරයට ගනු ලබන නීති විරෝධී ගිනි අවි හා අත් බෝම්බ සම්බන්ධයෙන් පුද්ගලික ඔත්තුකරුවන්ට ත්‍යාග මුදල් ගෙවීම - පොලිස් මූලස්ථානය.

විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා "යුක්තිය" මෙහෙයුම ක්‍රියාත්මක වෙමින් පවතින අතර එයට සමගාමීව සංවිධානාත්මක අපරාධකරුවන් මර්ධනය කිරීම සඳහා විශේෂ මෙහෙයුමක් 2024.03.19 වන දින සිට ආරම්භ විය. මෙයට අදාලව විශේෂ පොලිස් කණ්ඩායම් 20ක් බස්නාහිර පළාතේ සහ ගාල්ල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වෙමින් පවතී. එයට අමතරව දිවයින පුරා මෙහෙයුම් ක්‍රියාත්මක වේ. තොරතුරු ලබා දෙන්නන්ට මේ වන විට තොරතුරු ලබාදීම සඳහා විශේෂ දුරකතන අංක 46ක් ප්‍රකාශයට පත් කර ඇත. එයට අමතරව රහස්‍යභාවය රැකෙන පරිදි වෙනත් ඕනෑම ආකාරයකට පොලිසියට තොරතුරු ලබාදීමේ හැකියාවද පවතී.

අපරාධ මර්ධනය කිරීමේ අරමුණින් ගිනි අවි සහ සංවිධානාත්මක අපරාධකරුවන් සම්බන්ධයෙන් තොරතුරු ලබා දෙන තොරතුරුකරුවන්ට වටිනා මුදල් ත්‍යාග ලබාදීමට පොලිස්පතිතුමා විසින් තීරණය කර ඇත.

ඒ අනුව පහත වගුවේ දැක්වෙන පරිදි පුද්ගලික ඔත්තුකරුවන්ට ත්‍යාග මුදල් ලබා දෙන අතර තොරතුරු වල රහස්‍ය භාවය ආරක්ෂා කරන බවද අවධාරණය කරමි.

| අවි වර්ගය | ගෙවනු ලබන ත්‍යාග මුදල (එක් අවියක් සඳහා ) | |
|---|---|---|
| | සැකකරුවෙකු සමග ගිනි අවියක් අත්අඩංගුවට ගැනීමට ලබා දෙන තොරතුරක් සඳහා තොරතුරුකරුට ගෙවනු ලබන ත්‍යාග මුදල | ගිනි අවියක් පමණක් සම්බන්ධයෙන් ලබා දෙන තොරතුරකට තොරතුරුකරුට ගෙවනු ලබන මුදල |
| ස්වයංක්‍රීය ගිනි අවි (T56, AK47, M16, SAR80, T81 හා වෙනත් ස්වයංක්‍රීය අවි) | 500,000/= | 500,000/= |
| අර්ධ ස්වයංක්‍රීය අවි (පිස්තෝල අවි, 84S, SLR, Auto Loading Shot Guns අවි හා අර්ධ ස්වයංක්‍රීය අවි) | 300,000/= | 300,000/= |
| රිවෝල්වර | 250,000/= | 250,000/= |
| රිපීටර් තුවක්කු | 250,000/= | 200,000/= |
| පතොරම් තුවක්කු (විදේශයන්හි නිෂ්පාදිත ) | 50,000/= | 25,000/= |
| විදේශයන්හි නිෂ්පාදිත අත්බෝම්බ | 50,000/= | 25,000/= |
| විදේශයන්හි නිෂ්පාදිත වෙනත් ස්වයංක්‍රීය අවි | 200,000/= | 200,000/= |
| විදේශයන්හි නිෂ්පාදිත වෙනත් ස්වයංක්‍රීය නොවන අවි | 200,000/= | 100,000/= |

මෙහිදී, අවි කිහිපයක් අත්අඩංගුවට ගත් අවස්ථාවකදී ඉහත දක්වා ඇති එම අවි වලට අදාල සම්පූර්ණ මුදලම ගෙවීමට කටයුතු කරන අතර මෙම ත්‍යාග මුදල් ගෙවීම 2024.03.20 වන දින සිට මාසයක කාලයකට පමණක් වලංගු වේ.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**